## ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය - 2018

-------------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
--------------------

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
------------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සමඟ අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 113 වගන්තිය ප්‍රකාරව, යම් ආස්ථිත්‍යයක් විසින් එහි මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි, ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි, අනිකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයෙහි හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දැක්වෙන එක් එක් විෂයයන්ට අයත් සටහන්වලට අදාළ තොරතුරුවල හරස් යොමු දැක්විය යුතුය. කෙසේ වෙතත්, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලගේ වාර්ෂික බෙදාහැරීම් සහ අලෙවි හා සංස්ථාපිත සන්නිවේදන වෙනුවෙන් වූ පිළිවෙලින් රු.1,516,290,000 සහ රු.77,419,743 ක් සඳහා ක්‍රිකට් ආයතනය ආදායම් ප්‍රකාශයෙහි සටහන් වශයෙන් දක්වා නොතිබුණි. තවද, විලම්භිත ආදායම වූ රු.10,703,573 සඳහා ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සටහන් ඇතුළත් කොට නොතිබුණි. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල විෂයයන් දෙකකට වඩා වැඩියෙන් අඩංගු ශේෂවල වෙන වෙනම සටහන් ලෙස හෙළිදරව් කරනු ලැබේ. | යම් ආස්ථිත්‍යයක් විසින් එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි, ලාභාලාභ ප්‍රකාශයෙහි, අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයෙහි හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දැක්වෙන එක් එක් විෂයයන්ට අයත් සටහන්වලට අදාළ තොරතුරුවල හරස් යොමු දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 වගන්තිය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම හා ඵලදායී ජීවිත කාලය යටත් පිරිසෙයින් එක් එක් මූල්‍ය වර්ෂයක් අවසානයේදී සමාලෝචනය කළ යුතුය. කෙසේ වෙතත්, සම්පූර්ණයෙන් ක්ෂය වූ පිරිවැය රු.1,154,458,140 ක් වූ තවදුරටත් භාවිතා කරන දේපල, පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මැතකදී නියමු ව්‍යාපෘතියක් ලෙස වත්කම් අගය කිරීම සඳහා තක්සේරු මණ්ඩලයක් පත් කරන ලදී. එහි නිර්දේශ මත අනෙකුත් සියලුම ස්ථානවල එය ක්‍රියාත්මක කරනු ලැබේ. | වත්කම්වල ඵලදායී ජීවිත කාලය හා අවශේෂ වටිනාකම යටත් පිරිසෙයින් එක් එක් මුදල් වර්ෂයක් අවසානයේදී සමාලෝචනය කළ යුතුය. |
| (iii) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 67 වගන්තිය ප්‍රකාරව දේපල, යන්ත්‍ර හා උපකරණ විෂයයක ධාරණ අගය එය අපහරණය කරන විට හෝ එය භාවිතයේ දී හෝ අපහරණයේදී අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම් එය වත්කමක් ලෙස හඳුනා නොගත යුතුය. කෙසේ වෙතත්, දේපල යන්ත්‍ර හා උපකරණ හඳුනා නොගැනීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | අනාගත මූල්‍ය ප්‍රකාශනවල දේපල, යන්ත්‍ර හා උපකරණ හඳුනා නොගැනීම පිළිබඳ විස්තීර්ණ ප්‍රතිපත්තිය ඇතුළත් කරනු ලැබේ. | දේපල, යන්ත්‍ර හා උපකරණ ලෙස හඳුනා නොගැනීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අනෙකුත් අත්තිකාරම් යටතේ රු.5,845,788 ක හඳුනා නොගත් ශේෂයක් අන්තර්ගතව තිබූ අතර එය 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන ගොස් ජංගම වත්කම් යටතේ දක්වා ඇත. කෙසේ වෙතත්, මෙම ශේෂය සමාලෝචිත වර්ෂය තුළදීවත් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලද අතර මෙම දිගුකාලීන හිඟ ශේෂ පිළිබඳව සොයා බැලීමට කමිටුවක් පත් කිරීමට කළමනාකාරීත්වය කටයුතු කර ඇත. එහි නිර්දේශ මත විධායක කමිටුවේ අනුමැතිය ලබාගෙන 2019 වර්ෂයේදී අවශ්‍ය සටහන් තබනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කඩිනම් පියවර ගත යුතු වේ. |
| (ii) | මහනුවර කටුගස්තොට පිහිටි පර්චස් 256 ක් වූ වලකුඹුරවත්ත නැමැති ඉඩම ක්‍රිකට් විද්‍යායතනයක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් වසර 30 ක බදු ගිවිසුමක් යටතේ 2017 අප්‍රේල් 29 දින බදු ගන්නා ලදී. වසර 30 ක බදු කාලය සඳහා ගෙවිය යුතු බදු | ඔබගේ යෝජනාව විධායක සභාවට ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල අදාළ ගැලපීම් සිදුකරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශවල එකී මුදල ආදායමට එරෙහිව අයකිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කුලිය රු.මිලියන 26.25 ක් විය. මෙකී බදු කුලී ගෙවීමට අමතරව රු.මිලියන 25 ක පරිත්‍යාගයක් ලෙස 2017 වර්ෂයේදී බදුකරු විහාරස්ථානයට ගෙවා ඇත. එය ආදායමට එරෙහිව අයකරනු වෙනුවට මූල්‍ය ප්‍රකාශවල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස පෙන්වා ඇත. | | |
| (iii) | 2018 වර්ෂයේ දී දකුණු අප්‍රිකා - ශ්‍රී ලංකා ක්‍රිකට් සංචාරයට අදාළව අනුග්‍රාහක අයිතිය වෙනුවෙන් ලැබිය යුතු ආදායම වූ රු.29,834,405 (එ.ජ.ඩො.187,085) ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම තුළ ඇතුළත් කර අනුග්‍රාහක සමාගමෙන් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, එකී ගනුදෙනුවට කෙරෙන සැක කටයුතු සහ අවිධිමත් මැදිහත් වීම සහ බලකිරීම හේතු කොට ගෙන එම මුදල අනුග්‍රාහකගෙන් අයකර ගැනීම සැක සහිත විය. | කළමනාකාරීත්වය විසින් සෝනි පික්චර් නෙට්වර්ක් ඉන්ඩියා (පුද්) සමාගම වෙත එන්තර වාසියක් යවා ඇති අතර එකී සමාගමෙන් හිඟ මුදල් අයකර ගැනීමේ ඉදිරි පියවර ගැනීම සඳහා නීතිඥයන්ට උපදෙස් දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (iv) | ජංගම නොවන වගකීම් යටතේ වෙනත් ණයහිමියන් ලෙස පෙන්වා ඇති රු.2,213,944,841 ක මුදල, මහින්ද රාජපක්ෂ ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු මුදලකි. කෙසේ වෙතත්, එකී වගකීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සනාථ කර නොතිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශනවල අංක 29 සටහන අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා රජය විසින් භාරගෙන ඇති අතර 2017 ඔක්තෝබර් 25 දිනැති අංක 17/1765/737/028 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඊට අවශ්‍ය අරමුදල් මහජන බැංකුවෙන් ලබාගත් ණය මුදලකින් පියවීමට ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා | මෙය රජයේ ප්‍රදානයක් ලෙස සැලකීමට අනුමැතිය දෙන ලෙස මහා භාණ්ඩාගාරයට යොමුකර ඇති අතර ඒ සඳහා පිළිතුරක් මේ වන තුරු ලැබී නැත. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

මහජන බැංකුව අතර ගිවිසුමකට එළඹීමට තීරණය විය. එහෙත් මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කිරීමට කිසිදු පියවරක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙන නොතිබුණි.

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හා වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | උපයෝගී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට ගෙවිය යුතු මුදල | 13,573,845 | 13,953,844 | 379,999 | මෙම වෙනස සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය සමඟ සසඳන ලදී. සැසඳීම ගැන විස්තරාත්මක අධ්‍යයනයකින් පසු අවශ්‍ය සටහන් 2019 වර්ෂයේදී කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශවල ඇති ශේෂ සැසඳීමට කඩිනම් පියවර ගත යුතුය. |

### 1.5.4 අවිනිශ්චිත ගිණුම්

| විෂයය | මුදල | අවිනිශ්චිතව පැවති කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ආපසු ගෙවිය යුතු විනෝද බදු ලෙස ගාල්ල මහනගර සභාවට | 5,585,673 | වසර 2 ට වැඩි | ඔබගේ නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදී. මේ පිළිබඳව කළමනාකාරීත්වයට දැනුම් දෙනු ලැබූ අතර පසුගිය වසර දෙක තුළදී ගාල්ල මහනගර සභාව විසින් මෙම මුදල ඉල්ලුම් කර නැත. 2019 වර්ෂයේදී පොත්වල අවශ්‍ය මූල්‍ය සටහන් තබනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන නිවැරදි කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම**

| | විෂයය | මුදල | ඉදිරිපත් නොකළ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (i) | ලැබිය යුතු අනුග්‍රාහක ගාස්තු | 36,820,238 | ලැබිය යුතු මුදලට සනාථ කිරීම් | ඔබේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. මෙම හිඟ පැරණි ශේෂ සොයා බැලීමට කළමනාකාරීත්වය විසින් කමිටුවක් පත් කිරීමට මූලික කටයුතු කර ඇත. එහි නිර්දේශය හා විධායක කමිටු අනුමැතිය මත අවශ්‍ය සටහන් 2019 වර්ෂයේදී තබනු ලැබේ. | ශේෂය සත්‍යාපනය සඳහා අනුග්‍රාහක ලැබිය යුතු ශේෂ සම්බන්ධව සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | අනෙකුත් ණයගැතියන් | 10,870,901 | ලැබිය යුතු මුදල් පිළිබඳ සනාථ කිරීම් | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. | ශේෂය සත්‍යාපනය කිරීම සඳහා අනෙකුත් ණයගැතියන්ගේ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | අත්තිකාරම්- ණය කාඩ්පත් | 1,829,153 | ලැබිය යුතු මුදල් පිළිබඳ සනාථ කිරීම් | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. | ශේෂය සත්‍යාපනය කිරීම සඳහා අත්තිකාරම් ණය කාඩ්පත් පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (iv) | අනෙකුත් අත්තිකාරම් | 11,620,076 | ලැබිය යුතු මුදල් පිළිබඳ සනාථ කිරීම් | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. | ශේෂය සත්‍යාපනය කිරීම සඳහා අනෙකුත් අත්තිකාරම් පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (v) | ලැබිය යුතු විනෝද බදු | 4,663,681 | ලැබිය යුතු මුදල් පිළිබඳ සනාථ කිරීම් | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. | ශේෂය සත්‍යාපනය කිරීම සඳහා ලැබිය යුතු විනෝද බදු පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (vi) | විදේශ ක්‍රිකට් මණ්ඩලවලින් ලැබිය යුතු මුදල් | 42,810,291 | ලැබිය යුතු මුදල් පිළිබඳ සනාථ කිරීම් | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. | ශේෂය සත්‍යාපනය කිරීම සඳහා විදේශ ක්‍රිකට් මණ්ඩලවලින් ලැබිය යුතු මුදල් පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (vii) | ගෙවිය යුතු තැගි මුදල් | 56,649,636 | ගෙවිය යුතු මුදල් පිළිබඳ සනාථ කිරීම් | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. | ශේෂය සත්‍යාක්ෂණය කිරීම සඳහා ගෙවිය යුතු තැගි මුදල් පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (viii) | ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයෙන් ලැබිය යුතු මුදල් | 88,338,882 | ලැබිය යුතු මුදල් පිළිබඳ සනාථ කිරීම් | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. | ශේෂය සත්‍යාක්ෂණය කිරීම සඳහා ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයෙන් ලැබිය යුතු මුදල් පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ix) | අනෙකුත් ගෙවිය යුතු මුදල් | 296,500,268 | ගෙවිය යුතු මුදල් පිළිබඳ සනාථ කිරීම් | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. | ශේෂය සත්‍යාක්ෂණය කිරීම සඳහා අනෙකුත් ගෙවිය යුතු මුදල් පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (x) | අත්තිකාරම් - සංචාරක අක්මුදල් | 2,106,403 | සනාථ කිරීම් සහ සවිස්තරාත්මක උපලේඛන | ගනුදෙනු කොහේ දී ඇණවුම් කළා දැයි ප්‍රභව ලියවිලි සමඟ අපි පරීක්ෂා කරමු. අනතුරුව අවශ්‍ය ගැලපුම් පොත්වල කරනු ලැබේ. | ශේෂය සත්‍යාක්ෂණය කිරීම සඳහා සංචාරක අත්තිකාරම් අග්‍රිම පිළිබඳ සනාථ කිරීම් හා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (xi) | තැන්පතු පොදු | 2,895,905 | ස්වාධීන සනාථ කිරීම් | රු.11,364,805 කින් රු.8,468,900 ක් ලංකා විදුලි බල මණ්ඩලයට අදාළ වේ. | ශේෂය සත්‍යාක්ෂණය කිරීම සඳහා තැන්පතු පොදු පිළිබඳ සනාථ කිරීම් හා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (xii) | ඉකුත් ගෙවීම් | 13,943,987 | සවිස්තරාත්මක උපලේඛන | වාර්ෂික ගෙවීම් ලෙස කලින් කරන ලද ගෙවීම්වලින් මෙම ගිණුම සමන්විත වේ. මේවා කාලයක් ඇතුළත ක්‍රමක්ෂය කරනු ලැබේ. | ශේෂය සත්‍යාක්ෂණය කිරීම සඳහා ඉකුත් ගෙවීම් පිළිබඳ සනාථ කිරීම් හා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (xiii) | ගෙවිය යුතු වෙළඳ ණය | 22,251,316 | තෙවන පාර්ශව සනාථ කිරීම් | මුළු ශේෂය වූ රු.172,474,317 ක මුදලින් රු.150,223,002 ක් පසුව 2019 වර්ෂයේදී පියවා ඇත. | ශේෂය සත්‍යාක්ෂණය කිරීම සඳහා ගෙවිය යුතු ණය පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (xiv) | උපචිත වියදම් | 9,717,265 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණය | මෙම මුදල් 2013 වර්ෂයට පෙර කාලයට අදාළ වේ. ගනුදෙනු කොහේදී ඇණවුම් කළාදැයි ප්‍රභව ලියවිලි ආශ්‍රයෙන් සොයා ගෙන ගිණුම් පොත්වල අවශ්‍ය සටහන් තබනු ලැබේ. | ශේෂ සත්‍යාපනය සඳහා විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (xv) | ලැබිය යුතු බදු | 349,879,316 | විස්තරාත්මක උපලේඛන හා උපකාරක ලියකියවිලි | මේ සම්බන්ධයෙන් අපගේ බදු උපදේශකයන් විසින් කාර්ය පැවරුමක් කරමින් සිටී. ඔවුන්ගේ අවසන් වාර්තාවත් සමඟ අවශ්‍ය ගැලපුම් කරනු ලැබේ. | ශේෂය සත්‍යාපනය කිරීම සඳහා විස්තරාත්මක උපලේඛන හා උපකාරක ලියකියවිලි විගණනයට පත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | එකතුව රු.20,237,784 ක් වූ අනුග්‍රාහක ලැබීම් ශේෂ 21 ක්, අයකර ගැනීමකින් තොරව වසර 4 කට වැඩි කාලයක් පැවතුණි. | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. | බාහිර පාර්ශවයන්ගෙන් ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ii) | වසරකට වැඩි කාලයක් අයනොවී පවතින රු.1,162,080 ක් වූ ලැබිය යුතු ප්‍රවේශ පත්‍ර විකුණුම් සහ එකතුව රු.243,500 ක් වූ වසර 2 කට වැඩි කාලයක් අය නොවී පවතින අනෙකුත් ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. | බාහිර පාර්ශවයන්ගෙන් ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.2,833,093 සහ එකතුව රු.1,960,274 ක් වූ අනෙකුත් ණයගැතියන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂයන් පිළිවෙලින් වසර 1 කට වැඩි හා 2 කට වැඩි කාලයක් හිඟව පැවතුණි. | ඔබගේ නිරීක්ෂණය සටහන් කරගන්නා ලදී. | බාහිර පාර්ශවයන්ගෙන් ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (iv) | එකතුව රු.4,663,681 ක් වූ ලැබිය යුතු විනෝද බදු අයකර ගැනීමට කටයුතු කර නොමැති අතර එය 2018 දෙසැම්බර් 31 දිනට වසරකට වැඩි කාලයක් හිඟව පැවතුණි. | මෙම මුදල 2015 වසරට පෙර කාලපරිච්ඡේදයට අදාළ ශේෂවලින් සමන්විත වේ. අපගේ ඉල්ලීම් පළාත් පාලන ආයතනවලින් විවාදයට ලක් කෙරේ. එකඟත්වයකට එළඹී | බාහිර පාර්ශවයන්ගෙන් ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

| | වහාම අවශ්‍ය සටහන් ගිණුම් පොත්වල සටහන් කරනු ලැබේ. | |
|---|---|---|

**1.6.2 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසරකට වැඩි කාලයක් හිඟව පවතින එකතුව රු.14,057,572 ක් වූ ගෙවිය යුතු ශේෂ සහ එකතුව රු.4,727,737 ක් වූ වසර 2 කට වැඩි කාලයක් හිඟව පැවති අනෙකුත් ශේෂයන් නිරවුල් නොකර පැවතුණි. | රු.15,472,618 ක් වූ හිඟ ශේෂයෙන් රු.1,415,046 ක් 2019 වර්ෂයේදී නිරවුල් කරන ලදී. | බාහිර පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් පියවීමට කාලීනව පියවර ගත යුතුය. |

**1.6.3 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 සිට 2018 දක්වා වූ කාලයට අදාළ රු.114,677,789 ක තරඟ සඳහා වූ අත්තිකාරම් සහ ක්‍රිකට් සංගම්වලට දෙන ලද 2007 සිට 2018 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ රු.83,615,044 ක ඉදිකිරීම් අත්තිකාරම් අයකිරීමකින් තොරව දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශවල ඉදිරියට ගෙන ගොස් තිබුණි. | ඔබගේ නිරීක්ෂණ සටහන් කරගන්නා ලදී. කළමනාකාරීත්වය විසින් මෙම පැරණි හිඟ ශේෂ සොයා බැලීමට කමිටුවක් පත් කිරීම ආරම්භ කර ඇත. එහි නිර්දේශ මත විධායක කමිටුවේ අනුමැතියෙන් 2019 වර්ෂයේදී අවශ්‍ය සටහන් තබනු ලැබේ. | අත්තිකාරම් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.7 අනාවරණය නොකළ සම්බන්ධිත පාර්ශව හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය "ක්‍රිකට් එඩ් (ගරන්ටි) සමාගම" නමින් සමාගමක් ස්ථාපිත කොට ඒ සඳහා වාර්ෂිකව රු.මිලියන 10 ක් වෙන්කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් විධායක කමිටුව අනුමත කරන ලදී. එයින් පුණ්‍ය කටයුතු හා සමායාත සමාජ වගකීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරෙණි.කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 ප්‍රකාරව මේ පිළිබඳ විස්තර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ලෙස මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර නොතිබුණි. | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 7 දෙනෙකු ශ්‍රී ලංකා ක්‍රිකට් එඩ් හි අධ්‍යක්ෂවරු වෙති. ඊළඟ වසරේ මූල්‍ය ප්‍රකාශනවල මේ පිළිබඳ හෙළිදරව් කිරීම් කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 ප්‍රකාරව මෙකී විස්තර ශ්‍රී ලංකා ක්‍රිකට් හි මූල්‍ය ප්‍රකාශවල සම්බන්ධිත පාර්ශව ලෙස හෙළිදරව් කිරීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා වූ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,149,937,564 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.2,118,960,664 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.30,976,900 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වියදම් රු.1,138,131,923 කින් වැඩි වුවද, ආදායම රු.1,160,301,204 කින් ඉහළ යාම හා බදු වියදම රු.1,057,190 කින් අඩුවීම එකී වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයට පෙර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ඉල්ලා අස් වූ නිලධාරීන් 17 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,080,825 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් 2015 වර්ෂයට පෙර ආයතනයෙන් ඉවත් වූ කාර්ය මණ්ඩලයට අදාළ වේ. | අස් වූ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |